CAT I
Level 6

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - VI වන මට්ටම**

**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2014/2015**

**කම්කරු නීතිය - LWU4323**

**කාලය - පැය එකයි.**

---

දිනය - 2015 සැප්තැම්බර් 08 වන දින        වේලාව - ප.ව.02.45- ප.ව. 03.45 දක්වා

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

01. අර්ජුන, නිව් ඩ්‍රීම්ස් ෆ්ලෝරා (පුද්ගලික) සමාගම වෙනුවෙන් මල් සැකසුම්කරුවෙකු ලෙස සේවය සපයයි. සමාගම, පාරිභෝගිකයින්ගෙන් සැරසිලි සඳහා වූ ඇනවුම් භාරගෙන ඒවා අර්ජුන වෙත ලබා දෙයි. සමාගමේ පූර්ව අනුමැතිය මත අර්ජුන තම කාර්යය සඳහා සහායකයින් කුලියට ගන්නා අතර තමන් විසින්ම සපයා ගන්නා මල්, ආකෘති හා උපකරණ යොදා ගනී. එසේවුවද, පාරිභෝගිකයින් සිදු කරන ගෙවීම් නිව් ඩ්‍රීම්ස් ෆ්ලෝරා සමාගම විසින් ලබාගෙන මාසය තුළ ලත් ඇනවුම් ප්‍රමාණය අනුව අර්ජුන වෙත සෑම මසකම කොමිස් මුදලක් ලබා දෙයි. සමාගම සමග ගිවිසුම පවත්වාගෙන යන අතරතුර දී, අර්ජුන හට වෙනත් පුද්ගලික කාර්යයන්ට සම්බන්ධ විය නොහැක. ඔහු සමාගමේ සාමාන්‍ය රාජකාරි වේලාව තුළ සමාගම් පරිශ්‍රයේ රැඳී සිටිය යුතු බව අපේක්ෂා කෙරේ. නමුත්, අර්ජුන කිසිදු දිනක පැමිණීමේ ලේඛණය අත්සන් නොකරන අතර වර්ෂ අවසාන ප්‍රසාද දීමනා සඳහා ද ඔහු හිමිකම් නොලබයි. අනෙකුත් සියලු සේවකයන් සඳහා සමාගම විසින් වර්ෂ අවසාන ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.

    නිව් ඩ්‍රීම්ස් ෆ්ලෝරා සමාගම, අර්ජුන සමග වූ ගිවිසුම අවසන් කර සමාගමට නව මල් සැකසුම්කරුවකු බඳවා ගැනීමට අදහස් කර ඇත.

    තමා නිව් ඩ්‍රීම්ස් ෆ්ලෝරා (පුද්ගලික) සමාගමේ සේවකයකු ද යන්න පිළිබඳව අර්ජුන ඔබගේ උපදෙස් විමසා සිටී.

    අදාළ පරීක්ෂණ හා නඩු තීන්දු නීතිය ඇසුරින් අර්ජුනට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

02. “සේවා යෝජකයා විසින් සේවකයාගේ කාර්යය, හැසිරීම, ස්වභාවය, ආයතනය හා අනෙකුත් සහෝදර සේවකයින් සමඟ ඔහුගේ සහයෝගිතාව හෝ රැකියාව හා අදාළ වෙනත් කරුණක් සම්බන්ධයෙන් යම් ඌණතාවක් හඳුනාගනු ලැබෙයි නම්, එම පරිවාසිකයා සේවයෙන් නෙරපා හැරීම සඳහා සේවා යෝජකයාට අයිතියක් පවතී. එසේ වුවද, එම අයිතිය පරම, සීමාරහිත හෝ ප්‍රශ්න කළ නොහැකි අයිතියක් නොවේ.”

මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා

***State Distilleries Corporation v. Rupasinghe*** (1994) 2 SLR 395 at p.401

විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුතාව විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL 6**
**CONTINUOUS ASSESSMENT TEST I– 2014/2015**
**LWU4323– LABOUR LAW**
**DURATION: 01 HOUR.**

---

**DATE: 08th September 2015** **TIME: 02.45 p.m. – 03.45 p.m.**

---

**Answer one (01) question only**

**Candidates will be penalized for illegible handwriting.**

01. Arjuna provides his service as a florist to New Drams Flora (Pvt.) Ltd. The Company collects decoration orders from its customers and passes them to Arjuna. Arjuna hires assistants for his work with prior permission of the Company, and uses his own flowers, structures and equipments. However, the New Drams Flora receives charges from the customers and pays a commission to Arjuna every month in accordance with the number of orders executed during the month. During the continuance of the contract with the Company, Arjuna cannot involve with any other private work, and he is expected to be in the Company premises during normal working hours of the Company. But, Arjuna never signs the attendance register, and he is not entitled to year-end bonus. The Company pays the year-end bonus to all other workers.

New Dreams Flora intends to terminate the agreement with Arjuna and recruit a florist to the company.

Arjune seeks your advice as to whether he is a workman of the New Drams Flora (Pvt) Ltd.

Advise Arjuna with relevant tests and case law. **(20 marks)**

02. "If the employee is found wanting in respect of his work, conduct, temperament, compatibility with the organization and his fellow employees, or any other matter relevant to his employment, the employer is entitled to dismiss the probationer. However that right is not absolute, unfettered or unreviewable".

Mark Fernando J. in ***State Distilleries Corporation v. Rupasinghe*** (1994)2 SLR 395 at p. 401

Critically comment on the validity of the above statement with reference to decided cases. **(20 marks)**

*-Copyrights reserved-*